# වතු අංශයේ සේවා නියුක්තිය හා සේවා වියුක්තිය






මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

පි.ඩබ්.චතුරිකා චන්ද්‍රසේන.

## 01.හැදින්වීම.

ශ්‍රී ලංකාවේ කෝපි,තේ,පොල්,රබර් යන වතු වැවිලි වගාවන් වල වර්ධනය ආරම්භ වනුයේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළදීය.මෙම වගාවන්ගේ ව්‍යාප්තියත් සමඟම එම වතු වල සේවය කිරීම සඳහා බ්‍රිතාන්‍යයින් විසින් ඉන්දීයාවෙන් කුළිකරුවන් ගෙන්වනු ලැබීය.එම කුළිකරුවන් වතුවල සේවය සඳහාම සිය ශ්‍රමය කැප කළ අතර වතු කම්කරු ආර්ථිකය වැසුණු ආර්ථිකයක් ලෙස ක්‍රියාත්මක විය.මෙම වතු කම්කරුවන් පීඩාවට පත් කරමින් මුල් කාලයේ තිබූ ආර්ථික ක්‍රමය වෙනස් කිරීමට වතු ජනසතුකරණය,ඉඩම් ප්‍රතිසංස්කරණය මෙන්ම 1977 හඳුන්වා දුන් විවෘත ආර්ථික ක්‍රමයද හේතු විය.මෙම වෙනස්කම් සමඟින් වතුකරයේ සිටි ද්‍රවිඩ ජනතාවගේ සම්බන්ධිතභාවය ලිහිල් වීම සිදු වූ අතර තමන්ගේ කැමැත්ත පරිදි රැකියාවක් තෝරා ගැනීමට නිදහසක් ඔවුන්ට ලැබුණි.අද වන විට වතු කම්කරුවෝ මෙතෙක් තමන්ගේ සාම්ප්‍රදායික රැකියාවන් ලෙස සලකමින් තිබූ තේ දළු නෙළීම,රබර් කිරි කැපීම,අතහැර තමන්ගේ කුසලතාවන් අනුව විවිධ සේවාවන් සපයන කාර්මික හා අනෙකුත් නූතන අංශයන්හි රැකියාවන් වෙත යොමු වෙමින් සිටි. ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකය නගා සිටුවීමට දායක වන වතු ශ්‍රමිකයන්ගේ පැමිණීම,සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය,මෙරට රජයන් විසින් ඔවුන් වෙනුවෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග සොයා බැලේ.


## 02.වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය ස්ත්‍රී,පුරුෂ භාවය හා අංශ අනුව 2018

| අංශය | | එකතුව | ස්ත්‍රී/පුරුෂභාවය | |
|---|---|---|---|---|
| | | | පුරුෂ | ස්ත්‍රී |
| එකතුව | සංඛ්‍යාව | 8,387,759 | 5,464,236 | 2,923,523 |
| | % | 100 | 65.1 | 34.9 |
| නාගරික | සංඛ්‍යාව | 1,411,795 | 956,535 | 455,260 |
| | % | 100 | 67.8 | 32.2 |
| ග්‍රාමීය | සංඛ්‍යාව | 6,584,360 | 4,284,246 | 2,300,114 |
| | % | 100 | 65.1 | 34.9 |
| වතු | සංඛ්‍යාව | 391,604 | 233,455 | 168,149 |
| | % | 100 | 57.1 | 42.9 |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2018

2018 වර්ෂයේ වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි පුරුෂ ජනගහනය ඉහළ අගයක් ගන්නා බව දක්නට ලැබේ.එය 233,455 කී.ප්‍රතිශතයක් ලෙස 57.1% වේ.

03.වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය ස්ත්‍රි,පුරුෂ භාවය හා අංශ අනුව 2018




ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2018

04.වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය ස්ත්‍රි,පුරුෂ භාවය හා අංශ අනුව 2017


| අංශය | සංඛ්‍යාව | එකතුව | ස්ත්‍රි/පුරුෂ භාවය | |
|---|---|---|---|---|
| | | | පුරුෂ | ස්ත්‍රි |
| එකතුව | % | 8,566,686 | 5,434,510 | 3,132,176 |
| | | 100 | 63.4 | 36.6 |
| නාගරික | % | 1,409,867 | 934.283 | 475,584 |
| | | 100 | 66.3 | 33.7 |
| ග්‍රාමිය | % | 6,741,144 | 4,272,009 | 2,469,045 |
| | | 100 | 63.4 | 36.6 |
| වතු | % | 415,675 | 228,128 | 187,547 |
| | | 100 | 54.9 | 45.1 |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2017

2017 වර්ෂයේ වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය ඉහත වගුවේ දැක්වේ.ස්ත්‍රි පාර්ශවයට සාපේක්ෂව පුරුෂ පාර්වයේ සහභාගිත්වය වැඩි බව දක්නට ලැබේ.එය 228,128 වේ.ප්‍රතිශතයක් ලෙස 54.9% කී.

2018 සහ 2017 වර්ෂය සංසන්දනය කර බැලිමේදී 2018 වර්ෂයේ පුරුෂ සහභාගිත්වය වැඩි බව දක්නට ලැබේ.

05.වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය ස්ත්‍රි,පුරුෂ භාවය හා අංශ අනුව 2017




ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2017

ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය වතු අංශයේ පුරුෂ පක්ෂය ඉහළ අගයක් ගනී.

2017 වර්ෂයේ වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය දැක්වේ.ස්ත්‍රී පාර්ශවයට සාපේක්ෂව පුරුෂ පක්ෂයේ වැඩිවීමක් දක්නට ලැබේ.පුරුෂ පක්ෂය 228,128 වේ.ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 54.9% කී.

2018 සහ 2017 වර්ෂය සංසන්දනය කර බැලිමේදී පුරුෂ සහභාගිත්වය 2018 වර්ෂයේ වැඩි බව දක්නට ලැබේ.2017 වර්ෂයේ ස්ත්‍රී සහභාගිත්වය වැඩි විමක් දක්නට ලැබේ.

## 06. රැකියාගත ජනගහන අනුපාතය ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය-2017

| අංශය | එකතුව | ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය | | |
|---|---|---|---|---|
| | | කෘෂිකර්මාන්ත | කර්මාන්ත | සේවා |
| ශ්‍රී ලංකා | 100 | 26.1 | 28.4 | 45.5 |
| නාගරික | 100 | 4.1 | 26.8 | 68.6 |
| ග්‍රාමීය | 100 | 28.2 | 29.4 | 42.3 |
| වතු | 100 | 63.3 | 17.3 | 19.4 |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2017

2017 වර්ෂයේ වතු අංශයේ රැකියාගත ජනගහන අනුපාතය සලකා බැලිමේදී,ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය වනුයේ කෘෂිකර්මාන්ත අංශයයි.එය ප්‍රතිශතයක් ලෙස 63.3% වේ.

## 07.රැකියාගත ජනගහන අනුපාතය ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය-2018

| අංශය | එකතුව | ප්‍රධාන කර්මාන්ත අංශය | | |
|---|---|---|---|---|
| | | කෘෂිකර්මාන්තය | කර්මාන්ත | සේවා |
| ශ්‍රී ලංකා | 100 | 25.5 | 27.9 | 46.6 |
| නාගරික | 100 | 4.4 | 25.5 | 70.1 |
| ග්‍රාමීය | 100 | 28.3 | 28.5 | 43.1 |
| වතු | 100 | 54.1 | 26.7 | 19.2 |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2018

2018 වර්ෂයේ වතු අංශයේ රැකියාගත ජනගහන අනුපාතය සලකා බැලිමේදි,ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය වනුයේ කෘෂිකර්මාන්ත අංශයයි.එය ප්‍රතිශතයක් ලෙස 54.1% වේ.

2017 වර්ෂයේ වතු අංශයේ රැකියාගත ජනගහන අනුපාතය සලකා බැලිමේදි,ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය වනුයේ කෘෂිකර්මාන්ත අංශයයි.එය ප්‍රතිශතයක් ලෙස දැක් වු විට 63.3% වේ.

2018 වර්ෂයේ වතු අංශයේ රැකියාගත ජනගහන අනුපාතය සලකා බැලිමේදි,ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය වනුයේ කෘෂිකර්මාන්ත අංශයයි.එය ප්‍රතිශතයක් ලෙස දැක් වු විට 54.1% වේ.

08.

| ප්‍රමිතිගත වයස් කාණ්ඩ අනුව ශ්‍රම බලකායේ සහභාගිත්වය | | | | | | |
|---|---|---|---|---|---|---|
| වයස් කාණ්ඩය | 2017 | | | 2018 | | |
| | සමස්ත | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ |
| වතු | 61.9 | 51.7 | 73.9 | 59.8 | 48.7 | 72.1 |
| 15-19 | 25.2 | 20.1 | 30.8 | 17.9 | 14.2 | 21.8 |
| 20-24 | 66.1 | 51 | 84.4 | 62.4 | 45.4 | 80.4 |
| 25-29 | 75.1 | 59.4 | 95 | 74.1 | 54.5 | 91.9 |
| 30-39 | 86.5 | 76.2 | 97.1 | 78.6 | 64.6 | 95.1 |
| 40+ | 56.6 | 47.5 | 67.9 | 59.4 | 49.7 | 70.5 |

2017,2018 වර්ෂයන්හි ප්‍රමිතිගත වයස් කාණ්ඩ අනුව ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය ඉහත වගුවේ දැක්වේ.2017 වර්ෂයේ වතු අංශයේ 30-39 වයස් කාණ්ඩයේ පුරුෂ පක්ෂයේ වැඩි අගයක් ගනී.එය ප්‍රතිශයක් ලෙස 97.1% කි. ස්ත්‍රී 76.2% ප්‍රතිශතයක් වේ.

2018 වර්ෂයේ පිරිමි පාර්ශවයේ සහභාගිත්වය වැඩි අනුපාතයක් ගනී.එය 95.1 %කී.30-39 වයස් බාණ්ඩයේ ගැහැණු පාර්ශවයේ වැඩි බවක් දක්නට ලැබේ.එය 64.6% කී.

මේ අනුව 2017,2018 වර්ෂ දෙකෙහිම වතු අංශයේ ප්‍රමිතිගත වයස් බාණ්ඩ අනුව ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය 30-39 වයස් බාණ්ඩයේ පුරුෂ පක්ෂයේ වැඩි බව දක්නට ලැබේ.

2017,2018 වර්ෂ දෙකෙහිම වතු අංශයේ ප්‍රමිතිගත වයස් බාණ්ඩ අනුව ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය 30-39 වයස් බාණ්ඩයේ පුරුෂ පක්ෂයේ වැඩි බව දක්නට ලැබේ.

## 09.ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනය අංශ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව-2017

| අංශය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | % | සංඛ්‍යාව | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| එකතුව | 100 | 7,277,049 | 1,857,537 | 25.5 | 5,419,512 | 74.5 |
| නාගරික | 100 | 1,382,978 | 354,591 | 25.6 | 1,028,387 | 74.4 |
| ග්‍රාමීය | 100 | 5,638,154 | 1,422,426 | 25.2 | 4,215,727 | 74.8 |
| වතු | 100 | 255,917 | 80,519 | 31.5 | 175,398 | 68.5 |

2017 වර්ෂයේ වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනය සලකා බැලූ විට වැඩි පිරිසක් ස්ත්‍රීන් බව දක්නට ලැබේ.එය 175,398 කි.ප්‍රතිශතයක් ලෙස 68.5% වේ. පුරුෂයන් 80,519 වන අතර එය ප්‍රතිශතයක් ලෙස 31.5% කි.

## 10.ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනය අංශ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව-2018

| අංශය | එකතුව | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | % | සංඛ්‍යාව | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| එකතුව | 100 | 7,808,473 | 2,024,084 | 25.9 | 5,784,396 | 74 |
| නාගරික | 100 | 1,434,306 | 371,678 | 25.9 | 1,062,628 | 74 |
| ග්‍රාමීය | 100 | 6,110,849 | 1,565,902 | 25.6 | 4,544,947 | 74.4 |
| වතු | 100 | 263,318 | 86,504 | 32.9 | 176,814 | 67.1 |

2018 වර්ෂයේ වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනය සලකා බැලූ විට,ස්ත්‍රී පාර්ශවයේ වැඩි බවක් දක්නට ලැබේ. එය 176,814 කි.ප්‍රතිශතයක් ලෙස දැක් වූ විට 67.1% වේ. පුරුෂ පාර්ශවය 86,504 වන අතර 32.9% ප්‍රතිශතයක් දැක්වේ.

2017,2018 වර්ෂයන්හි වතු අංශයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නොවන ජනගහනය සලකා බැලූ විට,ස්ත්‍රී පාර්ශවයේ වර්ෂ දෙකෙහිම වැඩි බවක් දක්නට ලැබේ.

## 11.රැකියාගත ජනගහනය 2017/2018

| අංශ | එකතුව | 2017 | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු |
| එකතුව | 51.8 | 72.4 | 34.3 | 49.5 | 70.8 | 31.2 |
| නාගරික | 48.3 | 70.6 | 29.6 | 47.6 | 69.6 | 28.3 |
| ග්‍රාමීය | 52.2 | 73.6 | 34.5 | 49.5 | 71.1 | 31.1 |
| වතු | 59.6 | 71.5 | 49.5 | 57 | 69.2 | 46 |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

2017,2018 වර්ෂයන්හි රැකියාගත ජනගහනය සලකා බැලූ විට 2017 හා 2018 වර්ෂ දෙකෙදිම වතු අංශයේ පුරුෂ සහභාගිත්වය වැඩි බව පෙනි යයි .එය ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට පිළිවෙලින් 71.5% හා 69.2% කී.

## 12.විරැකියා අනුපාතය

| අංශ | එකතුව | 2017 | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු |
| එකතුව | 4.2 | 2.9 | 6.5 | 4.4 | 3 | 7.1 |
| නාගරික | 4.4 | 3.4 | 6.3 | 4.1 | 3.4 | 5.7 |
| ග්‍රාමීය | 4.2 | 2.7 | 6.7 | 4.5 | 2.9 | 7.5 |
| වතු | 3.7 | 3.3 | 4.2 | 4.7 | 4 | 5.7 |

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

විරැකියා අනුපාතය සලකා බැලූ විට 2017, 2018 වර්ෂයන්හි ස්ත්‍රී අනුපාතය අඩු බව දක්නට ලැබේ.

**රැකියාගත ජනගහනය 2017/2018**

පුරුෂ සහභාගිත්වය වැඩිය.

2017-පුරුෂ-71.5%

2018-පුරුෂ-69.2%

## 13. නිගමන හා යෝජනා

**වතු කම්කරුවන් වෙනුවෙන් අතිතයේ රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**

- වතු කම්කරුවන් සඳහා සුහසාධන කටයුතු, ගමන් හා ආහාර වියදම් යටත් විජිත රජය දරණ ලද අතර නොම්ලේ ලැයිම් කාමර සැපයීම,වත්ත තුළ අධ්‍යාපන කටයුතු ආරම්භ කිරිම,දිවා සුරැකුම් මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් පාසල් ආරම්භ කිරිම සිදුකරන ලදි.
- ලංකාවේ මැතිවරණ ක්‍රමය මගින් ද්‍රවිඩ කම්කරුවාගේ ඡන්ද අයිතිය ලබා දිමද සිදු කර ඇත.

**වතු කම්කරුවන් වෙනුවෙන් වර්තමානයේ රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**

- ✓ වතු ප්‍රදේශවල මනා සෞඛ්‍ය සේවාවක් සැපයීම තුළින් ජිවන තත්වය උසස් කරලිම හා රෝග නිවාරණ අවස්ථා වැඩි දියුණු කිරිම.
- ✓ සෞඛ්‍ය ක්ෂේත්‍රයට යටිතල පහසුකම් හා පුහුණු වෛද්‍ය කාර්ය මණ්ඩල වැඩි දියුණු කිරිම තුළින් ජිවන තත්වය උසස් කරලිම හා රෝග සුව කිරිමේ අවස්ථා බහුල කිරිම.
- ✓ පෙර පාසල්ඉදි කිරිම හා නව ගුරුවරුන් බඳවා ගැනිම හා ගුරුවරුන්ට මනා පුහුණුව ලබා දීම.
- ✓ පාසල් දියුණු කිරිම.
- ✓ ද්විතියීක අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවිම.
- ✓ ක්‍රියාකාරි ඉගෙනුම් මධ්‍යස්ථාන ඉහළ නැංවිම හා සමාන අධ්‍යාපනික පරිසරයක් ඇති කිරිම.
- ✓ අවිධිමත් අධ්‍යාපනයේ ගුණාත්මක බව නැංවිම.
- ✓ සුහසාධන පහසුකම් සැපයීම සහ වතු ප්‍රජාව හා කළමනාකරණය අතර සහයෝගිතාව වර්ධනය කිරිමට වතු අංශය තුළ පවත්නා රැකියා පසුබිම හොඳ තත්ත්වය ගෙන ඒම.
- ✓ වෘත්තිය මඟපෙන්වීම හා වෘත්තිය අධ්‍යාපනය තුළින් වතුකරයේ තරුණයන්ට රැකියා ඉඩ ප්‍රස්ථා පුළුල් කිරිම.
- ✓ ව්‍යවසායකත්ව පුහුණුව හා සුළු පරිමාණ යෝජනා ක්‍රම දිරිගැන්විම මඟින් කුසලතා සංවර්ධනය සම්බන්ධයෙන් අවස්ථාවන් උදා කර දීම.

**නිගමන**

- ➢ වතු අංශයේ ජනතාවගේ ජිවන තත්වය අනෙකුත් අංශයන් වන ග්‍රාමිය හා නාගරික අංශයන්ට සාපේක්ෂව අඩු දියුණු මට්ටමක පවතී.
- ➢ 2017/2018 වර්ෂයන්හි ආර්ථික වශයෙන් ක්‍රියාශිලි ජනගහනය,රැකියාගත ජනගහනය,ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය අනුව 30-39 වයස් කාණ්ඩයේ පුරුෂ පක්ෂය ඉහළ අගයක් ගනී.
- ➢ (2017/2018) වර්ෂයන්හි විරැකියා අනුපාතය අනුව ස්ත්‍රි පාර්ශවයේ අනුපාතය අඩු බව පෙනි යයි.
- ➢ 2017/2018 වර්ෂයන්හි රැකියාගත ජනගහන අනුපාතය අනුව ප්‍රධාන කර්මාන්තය කෘෂිකර්මාන්තය වේ.